# පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ
# පුරප්පාඩු

මෙම විශ්වවිද්‍යාලයේ ශාරීරික අධ්‍යාපන අංශයේ පිහිණුම් තටාක ජීවිතාරක්ෂක (කොන්ත්‍රාත්) තනතුර සඳහා අපේක්ෂිත සුදුසුකම් සහිත අයදුම්කරුවන්ගෙන් පමණක් අයදුම්පත් කැඳවනු ලැබේ.

## පිහිණුම් තටාක ජීවිතාරක්ෂක (කොන්ත්‍රාත්)

**වැටුප**

රු.29,915/- ක මාසික මූලික වැටුපක් ගෙවනු ලබන අතර, ජීවන වියදම් දීමනාව වශයෙන් රු.17,800/- ක මුදලක් සහ රු. 5,000/- ක මුදලක් ගෙවනු ලැබේ.

**අධ්‍යාපන සුදුසුකම් -**

සිංහල සහ ගණිතය යන විෂයන්ට සම්මාන සාමාර්ථ සහිතව විෂයන් 06ක් අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයෙන් එකවර සමත්විය යුතුය.

**වෘත්තීය සුදුසුකම් -**

01. ශ්‍රී ලංකා ජීවිතාරක්ෂක සංගමය මගින් නිකුත් කරනු ලබන ILS Pool Lifeguard සහතිකය ලබා තිබිය යුතුයි.

02. ශ්‍රී ලංකා ජීවිතාරක්ෂක සංගමය මගින් නිකුත් කළ යාවත්කාලීන කරන ලද වලංගු බලපත්‍රයක් ලබා තිබිය යුතුයි.

03. **පහත සඳහන් ඇගයුම් නිර්ණායක මත පදනම්ව යෝග්‍යතා පරීක්ෂණයක් පවත්වනු ලැබේ**
    - ➤ විවේක නොගෙන මීටර 200 නිදහස් ආර ඉසව්ව මිනිත්තු 03කින් පිහිනීමේ හැකියාව
    - ➤ හිස ජලයට ඉහළින් තබාගෙන මීටර 50ක් ළය ආර ඉසව්ව මිනිත්තු 01කින් පිහිනීමේ හැකියාව
    - ➤ බාහුවල ආධාරයක් නොමැතිව මිනිත්තු 01ක් ජලයේ රැඳී සිටීමේ හැකියාව (Treading Water)
    - ➤ තටාකයේ ගැඹුර මීටර 5.5ක් වන ස්ථානයකට තෙවරක් කිමිදී නැවත පැමිණීමේ හැකියාව
    - ➤ මිනිස් අනුරුවක් භාවිත කරමින් වැඩිහිටි, ළමා, ළදරු අයට කෘත්‍රිම ශ්වසනය දීමේ හැකියාව

**පළපුරුද්ද**

පිළිගත් ආයතනයක පිහිණුම් තටාක ජීවිතාරක්ෂක තනතුරේ වසර 02 ක සේවා පළපුරුද්දක් ලබා තිබීම.

පුද්ගල අන්තර් සම්බන්ධතා කුසලතා සහ වෙනත් උසස් අධ්‍යාපනික සහ වෘත්තීය සුදුසුකම් අමතර සුදුසුකම් ලෙස සැලකේ.

**සටහන :**

(අ) තෝරාගනු ලබන අයදුම්කරුවන් විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලට දායක වනු ඇත. ඒ අනුව සේවකයාගේ වැටුපෙන් 08%ක් විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලට බැර කරනු ලබන අතර එම වැටුපෙන් 12%ක් සේව්‍යයා විසින් අර්ථසාධක අරමුදලට බැර කරනු ලැබේ. මීට අමතරව සේව්‍යයා විසින් වැටුපෙන් 3% ක ප්‍රමාණයක් සේවා නියුක්තයන්ගේ භාරකාර අරමුදලට බැර කරනු ලැබේ.

(ආ) අයදුම්කරුවන් නම නම, උපන්දිනය, වයස, ලිපිනය, ජාතික හැඳුනුම්පත් අංකය, දුරකථන අංකය, අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද සම්බන්ධ තොරතුරු හා තමන් පිළිබඳව විමසිය හැකි දෙදෙනෙකුගේ නම් ද ඇතුළත්ව සකස් කරන ලද අයදුම්පත් අදාළ තොරතුරු සනාථ කිරීමට යොදා ගන්නා ලියකියවිලි ද සමඟ 2024.03.25 දින හෝ එදිනට පෙර ලැබෙන සේ, **සහකාර ලේඛකාධිකාරී, අනධ්‍යයන ආයතන අංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය, පේරාදෙණිය** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් පෞද්ගලිකව භාර නොගන්නා අතර පෞද්ගලිකව භාර දෙන අයදුම්පත් සම්බන්ධව වග කියනු නොලැබේ. අයදුම්පතෙහි විමසා ඇති අවශ්‍ය විස්තර සඳහන් නොකිරීම, අපැහැදිලි වීම, සනාථ කිරීම්වලට අදාළ ලියකියවිලි නොමැති වීම හෝ අයදුම්පත් දැන්වීමේ සඳහන් වෙනයම් අදාළ අවශ්‍යතාවයක් සපුරා නොමැති සහ අයදුම්පත් භාරගන්නා අවසන් දිනෙන් පසු ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරේ. එසේ යම් අයදුම්පත්‍රයක් ප්‍රතික්ෂේප කළ විට මොනයම් හේතුවක් නිසා වුවද එම අයදුම්පත්‍රය නැවත සැලකිල්ලට භාජනය කරනු නොලැබේ.

**වැඩබලන ලේඛකාධිකාරී,**
**පේරාදෙණිය විශ්වවිද්‍යාලය, පේරාදෙණිය.**